## IOC පිරවුම්හල් හා ලාෆ්ස් සුපිරි වෙළෙඳසල් ආශ්‍රිතව

# ටිගෝ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ජාලය පුළුල් කෙරේ




පාරිභෝගික පහසුකම් වර්ධනය කිරීමේ අදහසින් ටිගෝඩ සමාගම තම පාරිභෝගිකයන්ට මහා සේවයක් ලබාදීම පිණිස වඩා පුළුල් පාරිභෝගික මධ්‍යස්ථාන ගණනක් තෝරාගත් IOC පිරවුම්හල් හා ලාෆ්ස් සුපිරි වෙළෙඳසල්වල පිහිටුවා ඇත.

මෙහි ප්‍රධාන අරමුණ වනුයේ ටිගෝඩ පාරිභෝගිකයන්ට ගමන් බිමන්වල යෙදෙන අතරතුර ඉතා පහසුවෙන් සේවා ලබාදීමය. එහිදී ඉන්ධන පිරවුම්හල් හා සුපිරි වෙළෙඳසල් පාරිභෝගිකයන් රැස්වන ප්‍රධාන ස්ථානයන් 2 ක් ලෙස ටිගෝ විසින් හඳුනාගෙන ඇත.

ගමන් බිමන්වල යෙදෙන අතරතුර පාරිභෝගිකයන්ට සේවා සැපයීම සඳහා මෙය සුදුසුම මාර්ගය වන බව සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී දුමින්ද රත්නායක මහතා පවසයි. අප සෑම විටම උත්සාහ දරන්නේ පාරිභෝගිකයාට වා පුළුල් හා උසස් මට්ටමේ සේවයක් ලබාදීමටයි. කාලය, පාරිභෝගිකයන්ට ඉතා වැදගත් වන අතර, වාහන තදබදය සමගම එක් ස්ථානයකින් තවත් ස්ථානයකට ගමන් කිරීමට දැඩි වෙහෙසක් දැරීමටත් වැඩි කාලයක් ගත කිරීමටත් සිදුවේ. මේ හේතුවෙන් අප පාරිභෝගිකයන් සමග ඉතා සමීපව කටයුතු කිරීමට මෙවැන්නක් තුළින් උත්සාහ දරනවා යනුවෙන් රත්නායක මහතා වැඩිදුරටත් පැවසීය.

අලුතින්ම හඳුන්වා දුන් Shop in Shop සංකල්පය අන්තර්ජාලය හරහාද සේවා සපයෙනු ඇත. බිල් ගෙවීම, පෙර ගෙවුම් හා පසුගෙවුම් සිම්පත් අලෙවිය Scratgh Card සහ රීලෝඩ්, Handsets හා විශේෂ අමතර සේවා මීට අයත්ය. ඉහත සඳහන් සේවාවන්ට අමතරව ඉන් එක් සේවා මධ්‍යස්ථානයක පහත සඳහන් ගනුදෙනු කිරීමේ හැකියාවද පවතී.

දුරකථන අංකය වෙනස් කිරීම, IMI වෙනස් කිරීම, ජංගම දුරකථන හා සිම් අක්‍රිය කිරීම, ස්ක්‍රැච් කාඩ්/E Pin සම්බන්ධ ගැටලු, දෙවෙනි සිම්පතක් ලබාගැනීම (නැතිවූ/හාස්නි වූ) ජංගම දුරකථන කාඩ්පත් ඉල්ලුම්පත්‍ර, සංක්‍රමණ සිම්පත් ලබා ගැනීම (Migration Sim) නව සිම් අලෙවිය, පසුගෙවුම් හා පෙරගෙවුම් සේවාවන් කොහුවල, මොරටුව, සහ මහරගම යනාදී ප්‍රදේශවල ඇති ලාෆ්ස් සන්-අප් සුපිරි වෙළෙඳසල්වලින් ලබාගත හැකි අතර දෙමටගොඩ, හැව්ලොක්ටවුන් සහ බම්බලපිටිය ප්‍රදේශවල ඇති IOC ඉන්ධන පිරවුම් හල්වලින්ද ලබාගත හැක. මෙම මධ්‍යස්ථානවල අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට නියමිත බැවින් මෙයින්ද පාරිභෝගිකයන්ට අමතර වාසිද හිමිවේ.

තවද මෙවැනි වැඩසටහනක් ජූනි මස 05 වැනි දින පෙරගෙවුම් හා පසුගෙවුම් පාරිභෝගිකයන් සඳහා පැවැත්විණ. අපගේ Shop in Shop මධ්‍යස්ථානයට පැමිණෙන සෑම අයකුටම ජයග්‍රාහකයෙක් වීමේ හැකියාව උදෙනු ඇතැයි රත්නායක මහතා පවසයි. ටිගෝහි විශ්වාසය අනුව මෙවැනි ස්ථානයන් වෙත පැමිණෙන පාරිභෝගිකයන්ට වඩා පුළුල් සේවයක් ලබාදීම මගින් පාරිභෝගිකයන් තුළ ටිගෝඩ සේවාවන් කෙරෙහි ඉමහත් පැහැදීමක් ඇතිවනු ඇත.

Shop in Shop මධ්‍යස්ථානයකදී පසුගෙවුම් සබඳතාවක් මිලදී ගන්නා අයකුට ජංගම දුරකථනයක් දිනා ගැනීමේ අවස්ථා උදාවේ. ජූනි මස තුළ මිලදී ගන්නා සෑම පෙරගෙවුම් සබඳතාවක් සඳහාම පාරිභෝගිකයකුට ජූලි මස සිට රු. 100 ක නොමිලේ කතා කාලයක් මාස 6 ක් දක්වා ලැබෙනු ඇත. මෙහිදී මෙම දීමනාව හිමිවනුයේ මෙම මාසය තුළ රු. 100 ව වැඩියෙන් ඇමතුම් බාගතහොත් පමණි. තවද මෙම ස්ථානවලින් ලබා ගන්නා. රීලෝඩ් සඳහා පාරිභෝගිකයාට කාගීල්ස් එක්ස්ප්‍රස් තුළින් රු. 5000 ක් වටිනා බඩු මල්ලක් හෝ නොමිලේ ඉන්ධන (ෆුල් ටැන්ක්) දිනා ගැනීමේ අවස්ථාව ජූනි මාසය පුරා සතිපතා උදාවේ. මෙම ස්ථානයන්හිදී බිල් ගෙවීම් වර්ධනය කිරීම සඳහා ටිගෝඩ බිල්පත් සඳහා ගෙවූ මුදල නැවත දිනා ගැනීමේ අවස්ථාවක්ද හඳුන්වාදී ඇත. එසේ ගෙවූ බිල්පතේ මුදල නැවත ලබාගැනීමේ දිනුම් ඇදීම සිදුවන්නේ සතියකට වරකි. වැඩසටහන් කාලය තුළ මධ්‍යස්ථානවලට පැමිණෙන පාරිභෝගිකයන්ට තිළිණයන්ද ටිගෝඩ වෙතින් පිරිනැමේ. මේ සඳහා කළයුත්තේ තම බිස්නස් කාඩ්පත් හෝ නම ලිපිනය ලියූ කූපනයක් දිනුම් ඇදීමේ බඳුනට බහාලීමයි.